රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 56/89(I)

රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා
- ස්වදේශ කටයුතු අමාත්‍යාංශය ,
නිදහස් චතුරශ්‍රය ,
කොළඹ , 07.

1993.04.23 වෙනි දින.

සියළුම ලේකම්වරුන් හා
දෙපාර්තමේන්තු ප්‍රධානයන් වෙත.

ජාතික රාජ්‍ය සේවය, පළාත් රාජ්‍ය සේවය සහ පළාත්
රාජ්‍ය සේවය සඳහා නිලධාරීන් මුදාහැරීමට අදාළ කරුණු.

1989 නොවැම්බර් මස 15 දින නිකුත් කරන ලද අංක 56/89 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි සඳහන් මධ්‍යම සේවාවන්හි හා දීප ව්‍යාප්ත සේවාවන්හි නිලධරයන්ගේ පත්කිරීම් , මාරුකිරීම් , සේවයෙන් පහ කිරීම හා විනය පාලනය පිළිබඳව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55 (3) වගන්ති ප්‍රකාර අමාත්‍ය මණ්ඩලයට පැවරී ඇති බලතල රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් ක්‍රියාත්මක කිරීමට පවරා දෙනු ලැබ ඇත. ඒ අනුව බලතල ක්‍රියාත්මක කළයුතු ආකාරය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ අංක ඡ01/92 හා 1992.02.26 දිත චක්‍රලේඛයෙන් නියම කරනු ලැබ ඇත.

02. 1987 අංක42 දරණ පළාත් සභා පනතේ 32 (2) වගන්තියට අනුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට ආණ්ඩුකාරවරයා විසින් බලතල පැවරිය හැක්කේ එම පණතේ 32 (1) වගන්තියෙහි සඳහන් පරිදි වෙනත් පවත්නා නීතිවල විධිවිධානවලට යටත්ව බැව් අවධාරණය කරනු ලැබේ.

03. ඒ අනුව 1989 නොවැම්බර් මස 15 වන දින නිකුත් කරන ලද අංක 56/89 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි (ආ) (III),(IV) සහ (V) අනුජේද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සහ 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ 32(1) හා (2) වගන්ති විධිවිධානවලට අනුකූල නොවන බව පෙනීගොස් ඇති බැවින් එම ජේද ඉවත් කොට පහත දැක්වෙන වගන්ති ආදේශ කරනු ලැබේ.

(III) දීප ව්‍යාප්ත සේවයේ නිලධරයන් පළාත් රාජ්‍ය සේවයට මුදාහරිනු ලබන කාලය තුළදී ඔවුන්ගේ පත්කිරීම්, මාරුකිරීම්, සේවයෙන් පහ කිරීම් හා විනය පාලනය කළයුත්තේ පහත දැක්වෙන බලධරයන් මගින් එක් එක් සේවාවන්ට අදාළ සේවා ව්‍යවස්ථාවන්හි ඇතුළත් නියමයන් හා කොන්දේසි වලට යටත්වය.

| සේවය | පරිපාලන [56/89 (II)] ~~පත්වීම්~~ බලධාරියා |
| --- | --- |
| ශ්‍රී ලංකා පරිපාලන සේවය | රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් . |
| ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය | භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් . |

| | |
|---|---|
| ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය | ඉංජිනේරු සේවා මණ්ඩලය. |
| ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය | විද්‍යාත්මක සේවා මණ්ඩලය. |
| ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය | අධ්‍යාපන සේවා කොමිෂන් සභාව. |
| ශ්‍රී ලංකා සැලසුම් සේවය | සැලසුම් සේවා මණ්ඩලය. |
| ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවය | කෘෂිකර්ම සංවර්ධන හා පර්යේෂණ - අමාත්‍යාංශයේ ලේකම්. |
| ශ්‍රී ලංකා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවය | - එම - |
| වෛද්‍ය සේවය (විශේෂඥ හා විශේෂඥ නොවන) | සෞඛ්‍ය හා වනිතා කටයුතු ලේකම්. |

(iv) ඉහත සඳහන් ගණවලට අයත් යම් නිලධරයකුට එරෙහිව විනයානුකූල ක්‍රියාමාර්ගයක් ගැනීම සඳහා බැලූ බැල්මට පෙනෙන සාධක ඇතොත් ඒ සම්බන්ධයෙන් මූලික විමර්ශන පවත්වා, චෝදනා කෙටුම්පත් කොට මූලික විමර්ශන වාර්තාව සමඟ අදාළ පත්කිරීමේ බලධරයා මගින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට ඉදිරිපත් කළයුතු වේ.

(v) දීප ව්‍යාප්ත සේවයේ නිලධරයන් පළාත් රාජ්‍ය සේවයේ තනතුරු දරමින් සිටින විට ඔවුන්ගේ වාර්ෂික වැටුප් වර්ධක පහත සඳහන් අයුරු අනුමත කෙරෙනු ඇත. 56/89 (ii)

II පන්තියේ නිලධාරීන් - ~~ප්‍රධාන ලේකම් විසින්~~ පරිපාලන නිලධාරියා

I පන්තියේ නිලධාරීන් - ~~ප්‍රධාන ලේකම්ගේ නිර්දේශ අනුව අදාළ පත්කිරීමේ බලධාරියා~~ පරිපාලන නිලධාරියා විසින්

(vi) යම් පළාත් ආණ්ඩුකාරවරයෙකු විසින්ම ඉහත දැක්වෙන යම් නිලධරයකු සඳහාම නිලධරයාගේ මුදාහැරීමේ කොන්දේසිවලට යටත්ව තනතුරට අදාළ රාජකාරී පැවරීමේ ලිපියක් නිකුත් කෙරෙනු ඇත.

( එම්. ඒ. ප්‍රනයිඩ් )

ලේකම්,

රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

ශා/